(27)

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1333/8 – 2004 මාර්තු 22 වැනි සඳුදා – 2004.03.22

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV(අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

### උතුරුමැද පළාත් සභාව

### 2003 අංක 03 දරන මුදල් (පරිපූරක විධිවිධාන) ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උතුරු මැද පළාතේ පළාත් සභාව විසින් සම්මත කොට 2004 ජනවාරි මස 29 වැනි දින උතුරු මැද පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් සහතික කරන ලද පූර්වෝක්ත ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැන ගැනීම සඳහා මෙහි පහත පළ කරමි.

ඩබ්ලිව්. ගුරුගේ,<br>
ලේකම්,<br>
උතුරු මැද පළාත් සභාව.

### 2003 අංක 03 දරන මුදල් (පරිපූරක විධිවිධාන) ප්‍රඥප්තිය

1990 අංක 13 දරන උතුරු මැද පළාතේ මුදල් ප්‍රඥප්තියේ ආවරණය නොවන එහෙත් 1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ 36 වන වගන්තියෙන් පළාත් සභාව වෙත පවරා දී ඇති ආදායම් මූලාශ්‍ර වලට සමහර බදු, බලපත්‍ර ගාස්තු සහ වෙනත් ගාස්තු අයකර ගැනීම සඳහා සහ දණ්ඩනයන් පැනවීම හා එකතු කිරීම සහ ඊට අනුෂාංගික වෙනත් කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.

*මුදල් (පරිපූරක විධිවිධාන) ප්‍රඥප්තිය*

සමහර බදු, බලපත්‍ර ගාස්තු හා වෙනත් ගාස්තු අයකර ගැනීම සහ දණ්ඩනයන් පැනවීම හා එකතු කිරීම සහ ඊට අනුෂාංගික වෙනත් කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.

මෙම ප්‍රඥප්තිය පහත සඳහන් ආඥාපනත් සහ නීති වලට අනුකූල වන්නේ ය.

1. කැගි කරහ ආඥාපනත
2. තුරහ කරහ ආඥාපනත
3. ඉඩම්.සංවර්ධන ආඥාපනත සහ රාජ්‍ය ඉඩම් ආඥාපනත
4. වෛද්‍ය ආඥාපනත
5. ඖෂධ ආඥාපනත

01 APR 2004
NATIONAL LIBRARY AND
DOCUMENTATION CENTRE

92067
07/06/04



6. පතල් සහ ඛණිජ ද්‍රව්‍ය නීති
7. පඩි හා මිමි ආඥාපනත
8. වන සත්ව හා වෘක්ෂලතා ආඥාපනත

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උතුරු මැද පළාතේ පළාත් සභාව විසින් මෙසේ සම්මත කරනු ලැබේ:-

ලුහුඩු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

1. මෙම ප්‍රඥප්තිය 2003 අංක 03 දරන උතුරු මැද පළාතේ මුදල් (පරිපූරක විධිවිධාන ප්‍රඥප්තිය) යනුවෙන් හඳුන්වනු ලබන අතර, මෙහි III පරිච්ඡේදය හැර අමාත්‍යවරයා විසින් ඒ සඳහා නියම කරනු ලබන දිනයකදී මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක විය යුතු ය.

## I වන පරිච්ඡේදය

### තෑගි තරඟ බද්ද

තෑගි තරඟ බද්ද.

2. (1) පළාත ඇතුළත ප්‍රවර්ධිත හෝ පවත්වනු ලබන සෑම තෑගි තරඟයක් වෙනුවෙන්ම (මෙහි මින් මතු "තෑගි තරඟ බද්ද" යනුවෙන් හඳුන්වනු ලබන) බද්දක් අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන යම් අනුප්‍රමාණ වලට අනුව පනවා අය කර ගත යුතුය.

මෙම ප්‍රඥප්තියෙහි කාර්ය සඳහා "තෑගි තරඟය" යන්නෙන් ද්‍රව්‍ය, මුදල් හෝ සේවාවන් ගෙන් තෑගි පිරිනමනු ලබන තරඟයක් අදහස් කරන නමුත් ලොතරැයියක් ඊට ඇතුළත් නොවේ.

(2) (අ) පළාත ඇතුළත තෑගි තරඟයක් ප්‍රවර්ධනයට හෝ පැවැත්වීමට අදහස් කරන සෑම තැනැත්තෙක් ම ඒ සඳහා මෙයින් සළසා ඇති විධිවිධානවලට අනුව බලපත්‍රයක් ලබා ගත යුතුය.

(ආ) පළාතේ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ අදහස් විමසා පහත සඳහන් කාරණා නියම කරනු ලබන නියෝග, අමාත්‍යවරයා විසින් සෑදිය හැකිය.

(i) (2) (අ) ඡේදය යටතේ සඳහන් කරනු ලැබූ බලපත්‍රයෙහි ආකෘතිය හා ඒ සඳහා ගෙවිය යුතු ගාස්තුව,

(ii) මෙම ප්‍රඥප්තිය යටතේ තෑගි තරඟයක් ප්‍රවර්ධනය හෝ පැවැත්වීම කළ හැකි ස්ථානය හෝ පරිශ්‍රය ; සහ

(iii) එවැනි තෑගි තරඟයක් ප්‍රවර්ධනය හෝ පැවැත්වීම කරන තැනැත්තා විසින් සැපයිය යුතු වාර්තා.

බද්දෙන් නිදහස් කිරීම.

3. පළාත ඇතුළත පුණ්‍ය කටයුතු, අධ්‍යාපනික හෝ ක්‍රීඩා කටයුතු වැඩි දියුණු කිරීම සඳහා ප්‍රවර්ධිත වූ හෝ පවත්වනු ලැබූ යම් තෑගි තරඟයක්, එකඟ වනු ලබන යම් කොන්දේසිවලට යටත්ව, මෙම ප්‍රඥප්තිය යටතේ අයකර ගත යුතු යම් බද්දකින් නිදහස් කිරීම අමාත්‍යවරයා විසින් කළ හැකිය.

යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් බලපත්‍රයක් රහිතව ලොතරැයියකට හෝ තෑගි තරඟයකට යොදා ගැනීම වරදකි.

4. මෙම ප්‍රඥප්තිය යටතේ කලින් බලපත්‍රයක් ලබා නොගෙන තෑගි තරඟයකට අදාල යම් කාර්යයක් සඳහා යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් තබා ගැනීම හෝ ප්‍රයෝජනයට ගැනීම හෝ ඒ ගැන දනිමින්ම යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් තබා ගැනීමට හෝ ප්‍රයෝජනයට ගැනීමට ඉඩදීම හෝ කුලියට දීම කරනු ලබන යම් තැනැත්තෙක් වරදකට වරදකරු විය යුතුය. මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් දහසකට නොවැඩි දඩයකින් හෝ තුන් මාසයකට නොවැඩි සරල බන්ධනාගාර ගත කිරීමකින් හෝ එකී දඩය හා බන්ධනාගාර ගත කිරීම යන දෙකින්ම හෝ ඔහු දඬුවම් ලැබිය යුතුය.

2 වන වගන්තිය යටතේ වූ නියෝගය පළ කිරීමෙන් මසක් ඇතුළත පළාත් සභාවට ඉදිරිපත් කළ යුතුය.

5. 2 (1) වන වගන්තිය යටතේ සාදන ලද සෑම නියමයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබ මාසයක් ඇතුළත පළාත් සභාවේ අනුමැතිය සඳහා එයට ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත නොකරනු ලැබූ යම් නියමයක් ඒ අනුමැතියේ දිනයේ සිට, පරිච්ඡින්න කරන ලද ලෙස සලකනු ලැබිය යුතුය. එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවක වලංගුභාවයට ඉන් හානියක් නොවිය යුතුය.

92067
05 APR 2004
NATIONAL LIBRARY AND
DOCUMENTATION CENTRE

II වන පරිච්ඡේදය

*ඔට්ටු ඇල්ලීම වෙනුවෙන් බද්ද*

ඔට්ටු ඇල්ලීම වෙනුවෙන් බද්ද.

6. (1) පළාත ඇතුළත වූ ස්ථානයක හෝ පරිශ්‍රයක දී මුදලට හෝ ණයට (පළාත තුළ හෝ ඉන් පිටත) යම් තුරඟ තරඟයකදී තබන ලද හෝ පිළිගනු ලැබූ සෑම ඔට්ටුවකින්ම (මෙහි මින් මතු "ඔට්ටු බද්ද" යනුවෙන් හඳුන්වනු ලබන) බද්දක්, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන අනුප්‍රමාණ අනුව පනවා අයකර ගත යුතුය.

(2) (1) වන උප වගන්තිය යටතේ සාදන ලද සෑම නියමයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබ මාසයක් ඇතුළත පළාත් සභාවේ අනුමැතිය සඳහා එයට ඉදිරිපත් කල යුතුය. එසේ අනුමත නොකරනු ලැබූ යම් නියමයක් අනනුමතයේ දිනයේ සිට පරිච්ඡින්න කරන ලද ලෙස සලකනු ලැබිය යුතුය. එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවක වලංගුභාවයට ඉන් හානියක් නොවිය යුතුය.

(3) මෙම වගන්තිය යටතේ වූ ඔට්ටු බද්ද ඔට්ටුවක් තැබූ විගසින්ම අයවිය යුතු වන අතර, එවැනි ඔට්ටු බද්දක් ගෙවීමට යටත් වන යම් තැනැත්තෙක් එක් එක් ලින් මාසය සඳහා ගෙවිය යුතු ඔට්ටු බදු වල ඓක්‍යය, එකී ලින් මාසය ගෙවී දින දහයක් ඇතුළත පළාතෙහි පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත ගෙවිය යුතු ය.

(4) ඔට්ටු බද්දක් ගෙවීමට යටත් වන යම් තැනැත්තෙක් (3) වන උප වගන්තියෙහි විශේෂිතව දක්වා ඇති පරිදි නියමිත දින දී හෝ ඊට පෙර එම බද්ද ගෙවීමට අපොහොසත් වන අවස්ථාවක, එම තැනැත්තා පැහැර හරින්නෙක් ලෙස සැලකිය යුතු ය.

(5) යම් ඔට්ටු බද්දක් ගෙවීම පැහැර හැර ඇති විට, පැහැර හරින්නා විසින් ගෙවීම පැහැර හැර ඇති මුදලෙන් සියයට දහයකට සමාන මුදලක් ද, ඉන්පසුව එළඹෙන සෑම මාසයක් සඳහා ම සියයට පනහක උපරිමයක් දක්වා සියයට දෙකක අමතර මුදලක් ද, දණ්ඩන වශයෙන් ගෙවිය යුතුය.

(6) (5) වන උප වගන්තියෙහි සඳහන් කල දණ්ඩනයන් ද ඇතුළුව යම් ඔට්ටු බදු මුදලක් ගෙවීම පැහැර හැර ඇති විට, එය පළාත් සභාවට අයවිය යුතු ණයක් ලෙස සලකා පැහැර හරින්නාගෙන් අයකර ගත හැකිය.

III වන පරිච්ඡේදය

*ඉඩම් හා ගොඩනැගිලි බද්ද*

ඉඩම් හා ගොඩනැගිලි බද්ද.

7. (1) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් එකී නියමයෙහි සඳහන් කරනු ලබන අනුප්‍රමාණයන්ට අනුව හා පාර්ලිමේන්තුව විසින් පනවා ඇති නීති වලින් අවසර ඇති ප්‍රමාණයට පළාත ඇතුළත පිහිටි යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් වෙනුවෙන් පවත්නා ප්‍රාග්ධන අගය අනුව බද්දක් පැනවීම හා අයකර ගැනීම කළ හැකිය.

(1) වන උප වගන්තයෙහි "ඉඩම" යන්නට රජයට අයිති යම් ඉඩමක් ද, "ගොඩනැගිල්ල" යන්නට රජයට අයිති යම් ගොඩනැගිල්ලක් ද ඇතුළත් වේ.

(2) (1) වන උප වගන්තිය යටතේ සාදන ලද සෑම නියමයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබ මාසයක් ඇතුළත පළාත් සභාවේ අනුමැතිය සඳහා එයට ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත නොකරනු ලැබූ යම් නියමයක් අනනුමතයේ දිනයේ සිට, පරිච්ඡින්න කරන ලද ලෙස සලකනු ලැබිය යුතුය. එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවක වලංගුභාවයට ඉන් හානියක් නොවිය යුතු ය.

(3) මෙම වගන්තියෙහි කාර්ය සඳහා "ප්‍රාග්ධන අගය" යන්නෙන් යම් ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් වන විට, එකී ගොඩනැගිල්ලට කරන ලද හෝ සවි කරන ලද වැඩි දියුණු කිරීම්, එකතු කිරීම්, සවි කිරීම් හා සවි කරන ලද ද්‍රව්‍ය ද එකී ගොඩනැගිල්ල පිහිටා තිබෙන ඉඩමේ මිළ ද ඇතුළුව එකී ගොඩනැගිල්ල ඉදිකිරීමට වැය වූ වියදම ද, යම් හිස් ඉඩමක් සම්බන්ධයෙන් වන විට, පසුගිය වර්ෂයෙහි දෙසැම්බර් මස 31 වන දිනට එකී ඉඩමෙහි වෙළෙඳ අගය අදහස් වේ.

(4) මෙම පරිච්ඡේදයෙහි ඇතුළත් විධිවිධාන අමාත්‍යවරයා විසින් ඒ සඳහා නියම කරනු ලබන දිනයකදී ක්‍රියාත්මක විය යුතු ය.

## IV වන පරිච්ඡේදය

*ඉඩම් සංවර්ධන ආඥාපනත හා රාජ්‍ය ඉඩම් ආඥාපනත යටතේ අන්සතු කරන ලද ඉඩම් සඳහා වූ ගාස්තු*

ඉඩම් සංවර්ධන ආඥාපනත සහ රාජ්‍ය ඉඩම් ආඥාපනත යටතේ අන්සතු කරන ලද ඉඩම් සඳහා වූ ගාස්තු.

8. පළාත ඇතුළත පිහිටා ඇති යම් ඉඩමක් සඳහා ඉඩම් සංවර්ධන ආඥාපනත හෝ රාජ්‍ය ඉඩම් ආඥාපනත යටතේ ගෙවිය යුතු යම් ගාස්තුවක් පළාතෙහි පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත ගෙවිය යුතු ය.

## V වන පරිච්ඡේදය

*වෛද්‍ය ආඥාපනත යටතේ අය කරනු ලබන ගාස්තු*

වෛද්‍ය ආඥාපනත යටතේ අයකරනු ලබන ගාස්තු.

9. සාමාන්‍යයෙන් පළාත ඇතුළත නේවාසික වූ යම් තැනැත්තෙකු මත වෛද්‍ය ආඥාපනත යටතේ පනවනු ලැබූ යම් අය කිරීමක් ද ඇතුළුව ඒ යටතේ අයකරනු ලබන යම් ගාස්තුවක් එම ආඥාපනත යටතේ එය ලබා ගැනීමට බලය ඇති අධිකාරිය විසින් හෝ පළාතෙහි පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් එම කාර්ය සඳහා පත් කරනු ලැබූ යම් වෙනත් තැනැත්තෙකු විසින් අයකර ගත යුතුය. එහෙත් කවර අවස්ථාවක දී වුවද එකී ගාස්තු හා අයකිරීම් එකී කොමසාරිස්වරයා වෙත ප්‍රේෂණය කළ යුතුය.

*ඖෂධ හා රසායන ද්‍රව්‍ය සඳහා බලපත්‍ර බද්ද*

ඖෂධ හා රසායන ද්‍රව්‍ය වෙළෙඳාම වෙනුවෙන් බලපත්‍ර බද්දක්.

10. (1) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියෝගයක් මගින් නියම කරනු ලබන අනුප්‍රමාණයට හෝ අනුප්‍රමාණවලට අනුව ඖෂධ හා රසායන ද්‍රව්‍ය වෙළෙන්දෙකු ලෙස බලපත්‍රයක් ලබාගෙන පළාත තුළ ඖෂධ හා රසායන ද්‍රව්‍ය වෙළෙඳ ව්‍යාපාරයක යෙදී සිටින සෑම තැනැත්තෙකු ම (මෙහි මින් මතු "ඖෂධ හා රසායන බද්ද" යනුවෙන් හඳුන්වනු ලබන) බද්දකට යටත් විය යුතු ය.

(2) (1) වන උප වගන්තිය යටතේ ඖෂධ හා රසායන ද්‍රව්‍ය බද්දකට යටත් වන්නා වූ සෑම තැනැත්තෙක්ම මෙම ප්‍රඥප්තිය බලාත්මක වන්නා වූ දින සිට මාසයක් ඇතුළත ඔහුට ලැබී ඇති බලපත්‍රයෙහි ද පිටපතක් සහිතව ඔහුට සපයනු ලබන යම් ආකෘති පත්‍රයක ඔහුගේ ව්‍යාපාර ස්ථානය පිළිබඳ වාර්තාවක් පළාතෙහි පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් පත් කරනු ලැබිය හැකි යම් නිලධරයෙකුට ඉදිරිපත් කළ යුතු ය.

(3) (1) වන උප වගන්තිය යටතේ පනවනු ලබන බද්ද සම්බන්ධයෙන් වන අනුප්‍රමාණය බලපත්‍ර ලත් වෙළෙන්දා ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යන පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකමට අනුපාතික විය යුතු ය.

(4) (1) වන උප වගන්තිය යටතේ සාදන ලද සෑම නියමයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබ මාසයක් ඇතුළත පළාත් සභාවේ අනුමැතිය සඳහා එයට ඉදිරිපත් කළ යුතුය. එසේ අනුමත නොකරනු ලැබූ යම් නියමයක් අනනුමතයේ දිනයේ සිට, පරිච්ඡින්න කරන ලද ලෙස සලකනු ලැබිය යුතුය. එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවක වලංගුභාවයට ඉන් හානියක් නොවිය යුතුය.'

## VI වන පරිච්ඡේදය

*ඛණිජ අයිතින් පිළිබඳ බද්ද*

ඛණිජ අයිතීන් පිළිබඳ බද්ද.

11. (1) පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක හෝ අවසර පත්‍රයක බලය යටතේ පළාත ඇතුළත පිහිටි ඉඩමකින් යම් ද්‍රව්‍ය කැණීමේ, සෙවීමේ, ලබා ගැනීමේ හෝ ඉවත් කරගෙන යාමේ අයිතිවාසිකම ලබා දී, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් නියම කරනු ලබන අනුප්‍රමාණයට හෝ අනුප්‍රමාණයන්ට අනුව වූ, (මෙහි මින් මතු "ඛණිජ බද්ද" යනුවෙන් හඳුන්වනු ලබන) බද්දක්, එවැනි තැනැත්තන්ට ලබා දී ඇති අයිතිය මත පළාත් සභාවේ යෝජනා සම්මතයක් මගින් පනවා අයකර ගත හැකිය.

(2) (1) වන උප වගන්තිය යටතේ පනවනු ලබන ඛණිජ බද්ද සම්බන්ධයෙන් වන අනුප්‍රමාණය හෝ අනුප්‍රමාණයන්, බලපත්‍රයෙන් ලබා දී ඇති අයිතිවාසිකම්වලට හා ව්‍යාපාරයේ පිරිවැටුම අනුපාතික විය යුතු ය.

(3) (1) වන වගන්තිය යටතේ සාදන ලද සෑම නියමයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබ මාසයක් ඇතුළත පළාත් සභාවේ අනුමැතිය සඳහා එයට ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත නොකරනු ලැබූ යම් නියෝගයක් අනනුමතයේ දිනයේ සිට, පරිච්ඡින්න කරන ලද ලෙස සලකනු ලැබිය යුතු ය.එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවක වලංගුභාවයට ඉන් හානියක් නොවිය යුතු ය.

VII වන පරිච්ඡේදය

*පඩි හා මිම් ආඥාපනත යටතේ අය කරනු ලබන ගාස්තු*

12. පළාත ඇතුළත පඩි හා මිම් ආඥාපනත යටතේ අයකර ගනු ලබන ක්‍රමවත් කිරීමේ ගාස්තු එම ආඥාපනත යටතේ ඒවා අයකර ගනු ලබන බලධරයා විසින් පළාතෙහි පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත ප්‍රේෂණය කළ යුතුය. පඩි හා මිම් ආඥාපනත යටතේ ක්‍රමවත් කිරීමේ ගාස්තු.

VIII වන පරිච්ඡේදය

*වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ වූ ගාස්තු*

13. පළාත ඇතුළත වූ යම් ප්‍රදේශයක් සඳහා වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ අයකර ගනු ලබන ගාස්තු එම ආඥාපනත යටතේ එම ගාස්තු අයකර ගැනීමට අයිතියක් ඇති බලධරයා විසින් හෝ පළාතෙහි පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් පත් කරන ලද යම් නිලධරයෙකු විසින් අය කර ගත යුතුය. එහෙත් කවර අවස්ථාවක දී වුවද එකී ගාස්තු පළාතෙහි පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත ප්‍රේෂණය කළ යුතුය. වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ ගාස්තු.

**IX** වන පරිච්ඡේදය

*සාමාන්‍ය*

14. (1) මෙම ප්‍රඥප්තිය 1990 අංක 13 දරන උතුරු මැද පළාතෙහි මුදල් ප්‍රඥප්තියට අතිරේකයක් වශයෙන් සැලකිය යුතු අතර, එකී මුදල් ප්‍රඥප්තියෙහි විධිවිධාන පරිපාලනය කරන පළාතෙහි පළාත් ආදායම් කොමසාරිස්වරයා මෙම ප්‍රඥප්තියෙහි කාර්ය සඳහා ද පළාතෙහි පළාත් ආදායම් කොමසාරිස්වරයා විය යුතුය. පළාතෙහි පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් මෙම ප්‍රඥප්තිය යටතේ ඔහුගේ සහායකයින්ට පවරා දෙනු ලබන බලතලවලට අනුව ඔවුන් ක්‍රියා කල හැකිය. මෙම ප්‍රඥප්තියෙහි සමහර කරුණු සම්බන්ධයෙන් 1990 අංක 13 දරන මුදල් ප්‍රඥප්තියෙහි විධිවිධාන අදාළ විය යුතු ය.

(2) 1990 අංක 13 දරන මුදල් ප්‍රඥප්තිය යටතේ බදු සහ වෙනත් අයකර ගැනීම් තක්සේරු කිරීමට ද ඒ යටතේ අභියාචනයන්ටද එහි සඳහන් කර ඇති වාර්තා හා දණ්ඩනයන්ට ද අදාළ විධිවිධාන, මෙම ප්‍රඥප්තිය යටතේ ද බදු සහ වෙනත් ගාස්තු තක්සේරු කිරීම, වාර්තා හා දණ්ඩන ආදිය සඳහා ද, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ වන අතරම, එම ප්‍රඥප්තිය යටතේ පළාතෙහි පළාත් ආදායම් කොමසාරිස්වරයා සතු සියළුම බලතල, එකී යම් කරුණක් සම්බන්ධයෙන් මෙම ව්‍යවස්ථාවෙහි විශේෂිතව සඳහන් කර නොමැති නම්, මෙම ප්‍රඥප්තිය සම්බන්ධයෙන් ද ඔහු විසින් ක්‍රියාත්මක කළ හැකිය.

15. මෙම ප්‍රඥප්තියෙහි යම් විධිවිධානයක් කඩ කරන හෝ ඒ අනුව කටයුතු කිරීමට අපොහොසත් වන ඕනෑම තැනැත්තෙක් මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් සිදු කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව රුපියල් දහසකට නොවැඩි දඩයකින් හෝ තුන් මාසයකට නොවැඩි සරල බන්ධනාගාර ගත කිරීමකින් හෝ එකී දඩය හා බන්ධනාගාර ගත කිරීම යන මේ දෙකින්ම හෝ දඬුවම් ලැබීමකට යටත් වන්නේ ය. වැරදි හා දණ්ඩන.

16. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ ප්‍රඥප්තියෙහි – අර්ථ නිරූපනය.

"අමාත්‍යවරයා" යන්නෙන් පළාතෙහි අමාත්‍ය මණ්ඩලයෙහි මුදල් විෂය භාර අමාත්‍යවරයා අදහස් වේ.

"පළාත" යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයෙහි උතුරු මැද පළාත අදහස් වේ.

"පළාත් සභාව" යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයෙහි උතුරු මැද පළාතෙහි පළාත් සභාව අදහස් වේ.

17. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය. අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

04-294

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.